# මූලික පිරිවෙන් ප්‍රථම වාර පරීක්ෂණය - 2019

# Primary Piriven First Term Test - 2019

(සියලු ම හිමිකම් ඇවිරිණි)
All Rights Reserved)

**4 ශ්‍රේණිය**

**සාමාන්‍ය විද්‍යාව I , II**

කාලය : පැය 02
Time :

## I පත්‍රය

**සැලකිය යුතුයි:**

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **නිවැරදි හෝ වඩාත්ම ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.**

1) සතුන් තුළ හමු වන තරගමය සම්බන්ධක පටකය කුමක්ද?
   1)පේෂී පටකය 2)ස්නායු පටක 3)රුධිර පටක 4)අපිච්ඡද පටක

2) මිනිසාගේ ශවසන පද්ධතියේ ආරම්භක අවයවය වන්නේ,
   1)නාස් කුහරය 2)ස්වාසනාලිකා 3)පෙණහැලි 4)ග්‍රසනිකාව

3) ආහාර ජිර්ණ පද්ධතිය ආශ්‍රිත රෝගයක් වන්නේ මින් කුමක්ද?
   1)මල බද්ධය 2)වකුගඩු අක්‍රීය විම 3)මුත්‍රාශයේ ගල් ඇති වීම 4)ඒඩ්ස්

4) රිච්ටර් මාපකය මගින් තොරතුරුගෙන එන්නේ කුමන ස්වභාවික ආපදාව පිළිබඳවද?
   1)නායයාම් 2)සුනාමි 3)ගංවතුර 4)අකුණු අනතුරු

5) ඝනත්වය මැනීමේ ජාත්‍යන්තර සම්මත ඒකකය කුමක්ද?
   1)$gcm^{-3}$ 2)$Kgm^{-3}$ 3)$Kgcm^{-3}$ 4)$mgcm^{-3}$

6) ඝන අවස්ථාවේ පවතින මූලද්‍රව්‍යයක් වනුයේ,
   1)ඔක්සිජන්ය 2)නයිඩ්‍රජන්ය 3)හයිට්‍රජන්ය 4)කාබන්ය

7) ඕසෝන් වියන ආරක්ෂා කර ගැනීමේ අරමුණින් පිහිටුවා ගන්නා සම්මුතිය වන්නේ,
   1)වියානා 2)මොන්ට්‍රියල් 3)කියාටෝ 4)රැම්සාර්

8) පරිසරයේ වාසය කරන ජීවීන් දෙදෙනෙකු ගත්විට එක් ජීවියෙකු තවත් ජීවියෙකු මත හෝ තුළ හිදිමින් එම ජීවියාගේ තම පෝෂණ අවශ්‍යතා සපුරා ගැනීම
   1)විලෝපීයතාව 2)පරපෝෂිතාව 3)සහජීවනය 4)තරගය

9) සෞරග්‍රහ මණ්ඩලයේ දීප්තිමත්ම ආකාශ වස්තුව ලෙස සැලකෙනුයේ කුමක්ද?
   1)පෘථිවිය 2)සෙනසුරු 3)සිකුරු 4)බුධ

10) ක්ෂුද්‍ර ජීවීන් කාණ්ඩයක් නොවන්නේ,
   1)බැක්ටීරියා 2)දිලීර 3)ඇනලීඩා 4)ඇල්ගී

# II පත්‍රය

- **ප්‍රශ්න 06කට පමණක් පිළිතුරු සපයන්න.**

(1) ශාකවල ප්‍රජනනය විවිධ ක්‍රම වලින් සිදු වේ.

i. ප්‍රජනනය යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද?

ii. මුල් මගින් ප්‍රචාරණය කළ හැකි ශාක වර්ග 03 ක් නම් කරන්න.

iii. බද්ධ කිරීම යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද? බද්ධ කිරීම සිදු කරන ආකාර 02 ක් නම් කර ඒවා විස්තර කරන්න.

(2+3+5 = 10)

(2) පරිසර සමතුලිතතාවය බිඳ වැටීම හේතුවෙන් පාරිසරික ගැටළු 04 ක් නම් කරන්න.

i. වර්තමානයේ බහුලව දක්නට ලැබෙන පාරිසරික අර්බුධ 04 ක් නම් කරන්න්.

ii. හරිතාගාර වායු වර්ග 04ක් නම් කරන්න.

iii. හරිතාගාර වායු අවම කිරීම සඳහා යොදා ගත හැකි ක්‍රියාමාර්ග 04 ක් ලියන්න්.

(4+2+4 = 10)

(3)


i. ප්‍රභාසංස්ලේෂණය යනු කුමක්ද?

ii. ප්‍රභාසංස්ලේෂණයට අවශ්‍ය සාදක මොනවාද?

iii. ප්‍රභාසංස්ලේෂණ ක්‍රියාවලිය සිදු වන ආකාරය වචන සමීකරණයක් මගින් විස්තර කරන්න.

(2+4+4 = 10)

(4)




i. පහත දැක්වෙන්නේ මිනිස් මුත්‍රවාහිනි පද්ධතියේ ප්‍රධාන කොටස් දැක්වෙන රූප සටහනකි. මෙහි A,B,C,D,E යන කොටස් නම් කරන්න.

ii. මුත්‍රවාහිනී පද්ධතිය ආශ්‍රිත රෝගාබාධ 02 ක් නම් කරන්න.

iii. මුත්‍රවාහිනි පද්ධතියේ යහපැවැත්ම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග 03 ක් ලියන්න.

(5+2+3= 10)

5) මිනිසාගේ යහපත සඳහා ඇතැම් ජීවීන්ගේ බෝ වීම පාලනය කිරීමට සිදු වන අවස්ථා ඇත.

i. ජීවීන්ගේ බෝවීම පාලනය කරන අවස්ථා 02 ක් ලියන්න.

ii. පලිබෝධකයින් පාලනය කිරීම සඳහා වර්තමානයේ භාවිතා කරන ක්‍රමවේදයන් 03 ක් ලියන්න.

iii. පරිසර පද්ධතියක් යනු කුමක්දැයි හඳුන්වා පරිසර පද්ධති සඳහා උදාහරණ 02 ක් ලියන්න.

(2+3+5 = 10)

6) පරිසර පද්තියක පැවැත්ම සඳහා ජෛව හා අජෛව සාදක අතර පවතින අන්තර් ක්‍රියා වැදගත් වේ. සියලුම ජෛව සාදක වල පැවැත්මට මේ අජෛව සාදක වැදගත් වේ.

i. ස්වාභාවික පරිසරයක පැවැත්මට බලපාන අජෛව සාදක 5ක් නම් කරන්න.

ii. ඔබ ඉහත සඳහන් කල අජෛව සාදක 02 ක් ගැන කෙටි විස්තරයක් ලියන්න.

(5+5 = 10)

7) පරිසර පද්ධතියක පැවැත්ම සඳහා ශක්තිය අවශ්‍ය වේ. පෘථිවිය මත තිබෙන සියලු පරිසර පද්ධති වලට ශක්තිය ලපයන මූලික ශක්ති ප්‍රභවය සූර්යයා වේ.

i. ප්‍රභාසංස්ලේෂණය යනු කුමක්ද?

ii. ආහාර දාමයක් යනු කුමක්දැයි හඳුන්වා උදාහරණයක් ලියන්න.

iii. ජෛව ගෝලයේ පැවැත්ම කෙරෙහි ඇති අහිතකර බලපෑම් 04ක් නම් කරන්න.

(2+4+4 = 10)